Remove Watermark Wondershare PDFelement

පළමු වාර ඇගයීම
முதலாம் தவணை மதிப்பீடு–
First Term Evaluation

ශ්‍රේණිය / தரம் / Grade : 09	විෂයය / பாடம் / Subject : විද්‍යාව	පත්‍රය / வினாத்தாள் / Paper : I, II	කාලය / காலம் / Time : පැය 02

නම :- .... විභාග අංකය :- ....

I පත්‍රය

උපදෙස් - සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1). නයිට්‍රජන් තිර කිරීමට දායකවන පසෙහි ස්වාධීනව වෙසෙන බැක්ටීරියාවකි.

(i). විබ්‍රියෝ කොළරේ (ii). ඇසටොබැක්ටර් (iii). ලැක්ටොබැසිලස් (iv). රයිසෝබියම්

2). විෂ හරණය කරන ලද ධූලක, එන්නත් ලෙස භාවිතා කරන අවස්ථාවකි.

(i). සරම්ප එන්නත (ii). ඉන්ෆ්ලුවෙන්සා එන්නත
(iii). පිටගැස්ම එන්නත (iv). පෝලියෝ එන්නත

3). උණසන්නිපාත රෝගය ඇති කරන ව්‍යාධිජනකයා මිනිස් දේහයට ඇතුල්වන ක්‍රමයකි.

(i). ආහාර ගැනීමේ දී මුඛය හරහා (ii). සම සිදුරු වීමෙන් ඇතිවන තුවාල හරහා
(iii). ශ්වසන මාර්ගය හරහා (iv). මදුරුවන් දෂ්ඨ කිරීමෙන් සම හරහා

4). දෘෂ්ටි විතානයේ ආලෝකයට සංවේදී සෛල <u>නොපිහිටන</u> ස්ථානය පහත සඳහන් ඒවායින් කවරක් ද?

(i). කහලපය (ii). ස්වච්ඡය (iii). මධ්‍ය කූපය (iv). අන්ධ බිංදුව

5). දෘෂ්ටි ආබාධ සම්බන්ධ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(i). දුර ඇති වස්තු පැහැදිලිව පෙනෙන නමුත් සමීපව ඇති වස්තු පැහැදිලිව නොපෙනීම අවිදුර දෘෂ්ටිකත්වය යි.

(ii). දුර දෘෂ්ටිකත්වය සඳහා අවතල කාච සහිත උපැස් පැළඳීම සුදුසු ය.

(iii). දුර ඇති වස්තු පැහැදිලිව පෙනෙන නමුත් සමීපව ඇති වස්තු පැහැදිලිව නොපෙනීම දුර දෘෂ්ටිකත්වය යි.

(iv). දුර දෘෂ්ටිකත්වය හා අවිදුර දෘෂ්ටිකත්වය ප්‍රවේණිගත ආබාධ වේ.

6). අක්ෂි කාචයේ පාරදෘශ්‍ය ස්වභාවය අඩු වීමත්, ආලෝක කිරණ නිසි පරිදි දෘෂ්ටි විතානය මත නාභිගත නොවීමත් හේතුවෙන් ඇති වන රෝගී තත්වය කුමක් ද?

(i). ග්ලුකෝමාව (ii). ඇසේ සුද ඇති වීම (iii). ඇස් ලෙඩ (iv). අක්ෂි ආසාදන

LIVEWORKSHEETS

Remove Watermark Wondershare PDFelement

7). කනෙහි ව්‍යුහය හා කෘත්‍යය පිළිබඳව ශිෂ්‍යයෙකු ඉදිරිපත් කළ අදහස් කීපයක් පහත දැක්වේ.

A - කන ශ්‍රවණ සංවේදනය ප්‍රතිග්‍රහණය කෙරෙන අවයවය යි.

B - කර්ණ සංඛය මගින් සිරුරේ සමබරතාවය රැක දෙයි.

C - අර්ධ චක්‍රාකාර නාල මගින් ශ්‍රවණය පිළිබඳ සංවේදනය ශ්‍රවණ ස්නායුවට ලබා දේ.

මෙම ප්‍රකාශවලින් සත්‍ය වන්නේ,

(i). A පමණි.　　(ii). A හා B පමණි.

(iii). A හා C පමණි.　　(iv). A B C ප්‍රකාශ තුනම නිවැරදිය.

8). දුර දෘෂ්ටිකත්ව දෝෂය මඟ හරවා ගැනීමට සුදුසු කාච යෙදීම පෙන්නුම් කරන්නේ පහත සඳහන් කවර රූප සටහනේ ද?

(i).



(ii).



(iii).



(iv).



Wondershare PDFelement

9). මූලද්‍රව්‍ය දෙකක් හෝ වැඩි ගණනක් නිශ්චිත අනුපාතයකට රසායනිකව සංයෝජනය වී සැකසුණු නිශ්චිත ගුණ දරණ සංශුද්ධ ද්‍රව්‍ය හැඳින්වීමට සුදුසු පදය කුමක් ද?

(i). මිශ්‍රණ　　(ii). මූලද්‍රව්‍ය　　(iii). සංයෝග　　(iv). ද්‍රාවක

10). $^{23}_{11}Na$ පරමාණුව සතු ප්‍රෝටෝන, ඉලෙක්ට්‍රෝන හා නියුට්‍රෝන ගණන පිළිවෙළින්,

(i). 11, 12, 11　　(ii). 12, 11, 11　　(iii). 11, 11, 12　　(iv). 23, 11, 13

11). C_2H_5OH යන රසායනික සූත්‍රයෙන් දැක්වෙන සංයෝගය,

(i). එතනෝල්　　(ii). ග්ලූකෝස්　　(iii). සුක්‍රෝස්　　(iv). ඇසිටික් අම්ලය

12). පහත සඳහන් කවර වගන්තිය නිවැරදි ද?

(i). සංශුද්ධ ද්‍රව්‍ය දෙකක් හෝ වැඩි ගණනක් එකතු වීමෙන් මිශ්‍රණ සෑදේ.

(ii). ස්ඵටිකීකරණය, මිශ්‍රණයක සංඝටක වෙන් කරන රසායනික ක්‍රමයකි.

(iii). මිශ්‍රණයක සුවිශේෂී ලක්ෂණයක් වන්නේ එහි පවතින සංඝටක භෞතික ක්‍රම මගින් වෙන් කිරීමට නොහැකි වීමයි.

(iv). ආසුැත ජලය මිශ්‍රණ සඳහා සුදුසු උදාහරණයකි.

13). ඇදීමක් හෝ තල්ලු කිරීමක් බලය ලෙස හැඳින්වේ. බලය මැනීමේ අන්තර්ජාතික සම්මත ඒකකය,

(i). කිලෝ ග්‍රෑම්　　(ii). නිව්ටන් මීටර්　　(iii). මීටර්　　(iv). නිව්ටන්

LIVEWORKSHEETS

Remove Watermark Wondershare PDFelement

14). කනෙහි ඇතිවිය හැකි ආබාධිත තත්වයක් <u>නොවන්නේ</u> කුමන සාධකය ද?

(i). ශ්‍රවණ අස්ථිකා ඝනවීම (ii). බිහිරි බව

(iii). ශ්‍රවණ පරාසය අඩුවීම (iv). යුස්ටේකීය නාලය කෙටි වීම

15). දෛශික රාශියකට අයත් ලක්ෂණ දක්වා ඇත්තේ කවර පිළිතුරේ ද?

(i). නිශ්චිත දිශාවක් පමණක් ඇත.

(ii). විශාලත්වයක් ඇතත් නිශ්චිත දිශාවක් නොමැත.

(iii). විශාලත්වයක් මෙන්ම නිශ්චිත දිශාවක් ද ඇත.

(iv). නිශ්චිත දිශාවක් ඇතත් විශාලත්වයක් නැත.

16). පහත සඳහන් වැකි අතුරින් නිවැරදි වැකිය තෝරන්න.

(i). පෘෂ්ඨ වර්ගඵලය වැඩි වන විට පීඩනය වැඩි වේ.

(ii). පෘෂ්ඨ වර්ගඵලය වැඩි වන විට පීඩනය අඩු වේ.

(iii). පෘෂ්ඨ වර්ගඵලය අඩු වන විට පීඩනය අඩු වේ.

(iv). පීඩනය කෙරෙහි පෘෂ්ඨ වර්ගඵලයේ බලපෑමක් නැත.

17). වර්ගඵලය 5 m^2ක් වන පෘෂ්ඨයකට අභිලම්භව 80 N බලයක් යෙදූ විට එම පෘෂ්ඨය මත ක්‍රියා කරන පීඩනය කොපමණද?

(i). $\frac{80\ N}{5\times5\ m^2}$ (ii). $\frac{5m^2}{80N}$ (iii). $80N \times 5m^2$ (iv). $\frac{80\ N}{5\ m^2}$

18). බලයක උපයෝගී ලක්ෂ්‍යය යනු,

(i). වස්තුවක් මත බලය ක්‍රියා කරන ලක්ෂ්‍යය වේ.

(ii). වස්තුවක් මත බලයක් ක්‍රියා කරන වි කර කැවෙන ලක්ෂ්‍යය යි.

(iii). වස්තුවේ හරි මැදින් පිහිටා ඇති ලක්ෂ්‍යය යි.

(iv). වස්තුවේ චලන දිශාවට යොමු වී ඇති ලක්ෂ්‍යය යි.

19). A යනු බර පටවන ලද රෝද සහිත කරත්තයකි. සමාන බලයක් යොදා එය චලනය කිරීමට වඩාත් පහසු අවස්ථාව තෝරන්න.

(i).



(ii).



(iii).



(iv).



LIVEWORKSHEETS

Remove Watermark Wondershare PDFelement

20). පීඩනය වැඩි කර ගැනීම සඳහා උපක්‍රම යොදා ගෙන ඇත්තේ පහත සඳහන් කුමන් පිළිතුරට අනුව ද?

(i). අධික බර රැගෙන යන වාහනවල රෝද ගණන වැඩි කිරීම.

(ii). කැපීම අපහසු වන විට පිහියක් හොඳින් මුවහත් කිරීම.

(iii). බර වාහන සඳහා යොදන ටයර් පළලින් වැඩි වීම.

(iv). මඩ වගුරකින් එහා මෙහා යැම සඳහා පළලින් වැඩි ලැලි යොදා තිබීම.

Wondershare PDFelement

LIVEWORKSHEETS